# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1948/59 - 2016 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2016.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 (1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, (2014 අප්‍රේල් 22 දින අංක 1859/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදනු ලැබූ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පිහිටුවන ලබන නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ සහ II වැනි තීරයේ අනුරූප සටහන්වල සඳහන් වන ''වෛද්‍ය විද්‍යා පීඨය'' යන සටහනට ඉක්බිතිවම, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
| --- | --- |
| තාක්ෂණ පීඨය | 1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 2. ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 3. ඉංජිනේරු තාක්ෂණ අධ්‍යයන අංශය |
| ඉංජිනේරු පීඨය | 1. සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය |
| | 2. පරිගණක ඉංජිනේරු අධ්‍යයන අංශය |
| | 3. විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අධ්‍යයන අංශය |
| | 4. යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයන අංශය |
| | 5. විෂයාන්තර අධ්‍යයන අංශය''. |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 ජනවාරි මස 07 වැනි දින.
කොළඹ දී ය.

01 - 899


1A - PG 2771 — 507 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*